...ු ම හිමිකම් ඇවිරිණි]
...ப் பதிப்புரிமையுடையது)
...Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2008

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2008 අගෝස්තු

# I පත්‍රය

මිනිත්තු 45 යි...

...ත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ...ලක්කමෙන් | |
| ...කුරෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| ...ත්තර පත්‍ර පරීක්ෂක | | |
| ...කුණු පරීක්ෂක | | |
| ...කිත පරීක්ෂක | | |
| ...ක්ෂක | | |

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

**විභාග අංකය** ..............................


* ඔබේ විභාග අංකය මේ කොටුව තුළ ඇ... **තිත් ඉර මත ලියන්න.**
* තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇ... **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්... පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු හතරක් දී ඇති අංක **1** සි... **33** තෙක් ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝර... යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරු ලියන්නට ඇති අංක **34** සි... **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු **ති... ඉර මත ලියන්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසි එකෙ... සපයනු ලැබේ.


[2 වැනි පිටුව බලන...


* අංක 1 සිට 33 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර තෝරා, යටින් ඉරක් අඳින්න.


- අංක 1 සහ 2 ප්‍රශ්නවල කොටු හතරෙන් තුනක දැක්වෙන රූප දෙක අතර කිසියම් සමානකමක් තිබේ. එක කොටුවක ඇති රූප දෙක අතර එවැනි සමානකමක් **නොමැත.** එම කොටුව තෝරන්න.

1.


(1)


(2)



(3)



(4)

2.


(1)


(2)


(3)



(4)

3. කෙනකුගේ සිත ගැන යෙදිය **නොහැකි** උපමාවක් වන්නේ මින් කුමක් ද?
   (1) වෙඩරු පිඩක් මෙන් මොළොක් ය. (2) අවුල් වූ නූල් පන්දුවක් වැනි ය.
   (3) ගලක් මෙන් තද ය. (4) පස් පිඩක් මෙන් දැඩි ය.

4. කෙනකු බියට පත්වූ අවස්ථාවක් දැක්වීමට සුදුසු වන්නේ මින් කුමන උපමාව ද?
   (1) මුව පොව්වකු සේ වෙව්ලයි. (2) පරවියකු මෙන් හඬ නගයි.
   (3) සිංහයකු මෙන් ගොරවයි. (4) හාවකු සේ දුව පනියි.

5. "උඩ පැන්නොත් බිම වැටේ" යන යෙදුම පැහැදිලි කරන ප්‍රකාශය තෝරන්න.
   (1) උඩ නොපැන්නත් බිම වැටීමට ඉඩ තිබේ.
   (2) උඩ යන යමක් වේ නම් එය බිම පතිත විය යුතු ය.
   (3) වැඩියෙන් උඩ පැන්නොත් වැඩියෙන් බිම වැටේ.
   (4) උඩ පනින්න නම් බිම වැටිය යුතු ය.

- එක්තරා නගරයක පාසල, රෝහල, බස්නැවතුම හා දුම්රියපොළ පිහිටන අයුරු හා ඒවා යා කෙරෙන මාර්ග රූපයේ දැක්වේ. එම තොරතුරු අනුව අංක 6 හා 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




6. එක් ස්ථානයක සිට අඩු ම දුරකින් අනෙක් ස්ථාන තුනට ම යා හැකි වන්නේ කුමන ස්ථානයකින් ගමන ආරම්භ කළහොත් ද?
   (1) පාසල හෝ බස්නැවතුම
   (2) පාසල හෝ රෝහල
   (3) බස් නැවතුම හෝ රෝහල
   (4) දුම්රියපොළ හෝ බස්නැවතුම

7. ළමයකු පාසලේ සිට අනෙක් ස්ථාන තුනට ම අඩු ම දුරකින් ගමන් කළේ නම්, ඔහු ගිය මුළු දුර මීටර කීය ද?
   (1) 800 කි. (2) 900 කි.
   (3) 1000 කි. (4) 1100 කි.

8. දුම්රියක් 45 වෙනි කිලෝමීටර කණුවේ සිට 50 වෙනි කිලෝමීටර කණුව පසු කිරීමට මිනිත්තු 5 ක් ගතකොට තිබිණි. දුම්රිය එම වේගයෙන් ම ගමන් කළහොත් 80 වෙනි කිලෝමීටර කණුව පසුකිරීමට තවත් මිනිත්තු කීයක් ගතවේ ද?
   (1) 80 (2) 50 (3) 35 (4) 30

[3 වැනි පිටුව බලන්න

9\. හාල් 2 kg ක මිල = පරිප්පු 1 kg ක මිල
පරිප්පු 2 kg ක මිල = මිරිස් 1 kg ක මිල
එසේ නම් පහත වගුව අනුව වැඩි ම මිලක් ගෙවිය යුත්තේ කවුද?

| විජය | කමලා | සිරිල් | පාල |
|---|---|---|---|
| හාල් 2 kg<br>පරිප්පු 1 kg<br>මිරිස් 1 kg | හාල් 4 kg<br>පරිප්පු 2 kg<br>මිරිස් 1 kg | හාල් 1 kg<br>පරිප්පු 2 kg<br>මිරිස් 2 kg | හාල් 2 kg<br>පරිප්පු 1 kg<br>මිරිස් 2 kg |

(1) විජය (2) කමලා (3) සිරිල් (4) පාල

10\. වතුර බෝතල් 1 ක බර = කිරිපිටි පැකට් 2 ක බර
කිරිපිටි පැකට් 1 ක බර = තේ කොළ පැකට් 2 ක බර
එසේ නම් වැඩි ම බරක් ඇත්තේ කුමන බෑගයේ ද?



(1)



(2)



(3)



(4)

11\. නගරයක බස්නැවතුම්පොළ, ඔරලෝසු කණුවට මීටර 60 ක් නැගෙනහිරින් ද
පොලිසිය, ඔරලෝසු කණුවට මීටර 80 ක් දකුණින් ද
පාසල, පොලිසියට මීටර 60 ක් නැගෙනහිරින් ද පිහිටා තිබේ.
මේ අනුව බස්නැවතුම්පොළ පිහිටා ඇත්තේ පාසලට

(1) මීටර 80 ක් දකුණට ය. (2) මීටර 80 ක් උතුරට ය.
(3) මීටර 60 ක් දකුණට ය. (4) මීටර 60 ක් නැගෙනහිරට ය.

12\. විජය, ගාමිණීගේ තාත්තා ය. සිරිල්, විජයගේ බාල සහෝදරයා ය. කාන්ති, ගාමිණීගේ එක ම නැගණියයි. කාන්තිත් සිරිලුත් හමු වූ විට කාන්ති, සිරිල්ට ඇමතිය යුතු නෑදෑකම කුමක් ද?

(1) බාප්පා (2) මහප්පා (3) මාමා (4) අයියා

13\. පහත දැක්වෙන්නේ දුම්රිය නැවතුම්පොළකින් පිටත්වීමට නියමිත දුම්රිය පිළිබඳ සටහනකි.

| ගමනාන්තය | පිටත්වීමට නියමිත වේලාව | | වෙනත් සටහන් |
|---|---|---|---|
| | පෙ.ව. | ප.ව. | |
| මාතර | 11.30 | ---- | පැයක් පමාවී ධාවනය වේ. |
| මහනුවර | ---- | 12.15 | |
| ගාල්ල | 8.30 | ---- | |
| අනුරාධපුරය | 10.30 | ---- | අවලංගු කරන ලදී. |
| බදුල්ල | ---- | 3.00 | |

එම සටහනට අනුව දුම්රිය ධාවනය වූයේ නම් එම දුම්රියපොළෙන් දුම්රිය පිටත් වූ අනුපිළිවෙළ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ගාල්ල - මාතර - මහනුවර - බදුල්ල
(2) ගාල්ල - අනුරාධපුරය - මහනුවර - බදුල්ල
(3) ගාල්ල - මහනුවර - මාතර - බදුල්ල
(4) ගාල්ල - මහනුවර - මාතර - අනුරාධපුරය

[4 වැනි පිටුව බලන්න

14. පන්තියක සිටින ළමයින් හතර දෙනකුගේ උපන්දින පහත දැක්වේ.

| | | |
|---|---|---|
| සමන් | - | 2001.01.24 |
| විදුර | - | 2000.12.31 |
| උත්පලා | - | 2001.08.30 |
| කමනී | - | 2000.08.18 |

මේ අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) කමනී උත්පලාට වඩා වැඩිමහල් ය. (2) විදුර සමන්ට වඩා බාල ය.
(3) උත්පලා සමන්ට වඩා වැඩිමහල් ය. (4) කමනී විදුරට වඩා බාල ය.

• පහත දී ඇති තොරතුරු ඇසුරෙන් අංක 15 හා 16 ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න.

| | | |
|---|---|---|
| සීනි 1 kg + තේ 250 g | තේ 250 g + බිස්කට් 500 g | සීනි 1 kg + බිස්කට් 500 g |
| රුපියල් 180 | රුපියල් 230 | රුපියල් 170 |

15. තේ 500 g + බිස්කට් 1 kg හි මිල කීය ද?
(1) රු. 230 (2) රු. 400 (3) රු. 410 (4) රු. 460

16. සීනි 2 kg + තේ 500 g + බිස්කට් 1 kg හි මිල කීය ද?
(1) රු. 290 (2) රු. 350 (3) රු. 410 (4) රු. 580

• 2009 වර්ෂයේ ජනවාරි 01 දින බ්‍රහස්පතින්දාවකි. ඒ අනුව අංක 17 හා 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

17. 2009 වර්ෂයේ ජනවාරි මාසයට ඇති බදාදා දින ගණනත් බ්‍රහස්පතින්දා දින ගණනත් පිළිවෙළින්
(1) 4 හා 4 වේ. (2) 4 හා 5 වේ. (3) 5 හා 4 වේ. (4) 5 හා 5 වේ.

18. 2009 වර්ෂයට ඇත්තේ දින 365 කි. එම වර්ෂයේ බ්‍රහස්පතින්දා දින කීයක් තිබේ ද?
(1) 48 (2) 50 (3) 52 (4) 53

• 2008 වර්ෂය, 21 වන සියවසෙහි පළමුවන දශකයට අයත් වේ. ඒ අනුව අංක 19 හා 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

19. ඔබ උපන් වර්ෂය අයත් වන්නේ,
(1) 19 වන සියවසෙහි දහවන දශකයට ය.
(2) 20 වන සියවසෙහි පළමුවන දශකයට ය.
(3) 20 වන සියවසෙහි දහවන දශකයට ය.
(4) 21 වන සියවසෙහි පළමුවන දශකයට ය.

20. 20 වන සියවසෙහි 6 වන දශකයට අයත් වර්ෂයක් වනුයේ
(1) 1955 ය. (2) 1965 ය. (3) 2055 ය. (4) 2065 ය.

21. ක්‍රීඩාපිටියක සිටි 10 දෙනකු අතුරෙන් 7 දෙනෙක් කුඩ ඉසලාගෙන සිටියහ. 6 දෙනක් හිස්වැසුම් පැළඳ සිටියහ. ඔවුන්ගෙන් සෑම අයෙක් ම එක්කෝ කුඩයක් ඉසලාගෙන නැතහොත් හිස්වැසුමක් පැළඳ සිටියහ. සමහරු හිස්වැසුම් පැළඳ කුඩ ද ඉසලාගෙන සිටියහ. එසේ හිස්වැසුම් පැළඳ කුඩ ද ඉසලාගෙන සිටි සංඛ්‍යාව කීය ද?
(1) 3 (2) 6 (3) 7 (4) 10

[5 වැනි පිටුව බලන්න

**22.** සනකයක පැති හයෙහි 1, 2, 3, 4, 5 සහ 6 යන ඉලක්කම් ලියා ඇති අයුරු පහත රූපවල දැක්වේ.




අවසාන රූපයේ උඩු මුහුණතේ **5** ඉලක්කම පෙනෙන්නේ කුමන ආකාරයට ද?



(1) (2) (3) (4)

- අංක **23** සහ **24** ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන රූපය යොදගෙන තෝරන්න.
එම රූපයේ දැක්වෙන්නේ නගර දෙකක මාර්ග සිතියම් දෙකකි. අංක 1 බස්නැවතුම්පොළ ද අංක 2 පාසල ද අංක 3 රෝහල ද අංක 4 පුස්තකාලය ද දක්වයි.





**23.** A ළමයා තම නිවසේ සිට මේ මාර්ගය ඔස්සේ ගමන් කළහොත් අඩු ම වාර ගණනක් වමට හැරෙන්නේ කුමන ස්ථානයට යාමට ද?

(1) බස්නැවතුම්පොළ (2) පාසල
(3) රෝහල (4) පුස්තකාලය

**24.** B ළමයා තම නිවසේ සිට මේ මාර්ගය ඔස්සේ ගමන් කළහොත් වැඩි ම වාර ගණනක් දකුණට හැරෙන්නේ කුමන ස්ථානයට යාමට ද?

(1) බස්නැවතුම්පොළ (2) පාසල
(3) රෝහල (4) පුස්තකාලය



**25.** මෙම රූපයේ සමචතුරස්‍ර කීයක් තිබේ ද?



(1) 8 (2) 11 (3) 12 (4) 15


[6 වැනි පිටුව බලන්න


- අංක **26** සහ **27** ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන රූපය තෝරන්න.

**26.**  නම්  = ............



(1) (2) (3) (4)

**27.**  නම්  = ............




(1) (2) (3) (4)

- කිසියම් රටාවක් ගොඩ නැඟීම සඳහා

□ එක්වරක් ද ▭ දෙවරක් ද ○ තුන්වරක් ද △ සිව්වරක් ද යොදා ගත යුතු ය.


ඒ අනුව, අංක **28** සහ **29** ප්‍රශ්නවල නිවැරදි ව ගොඩ නගා ඇති රූප තෝරන්න.

**28.**



(1) (2) (3) (4)

**29.**




(1) (2) (3) (4)

[7 වැනි පිටුව බලන්න


● අංක **30** සහ **31** ප්‍රශ්නවල සිදුවීම් දෙකක අවස්ථා පහකට අදාළ රූප, අනුපිළිවෙළ වෙනස් කොට A, B, C, D සහ E වශයෙන් දක්වා තිබේ. එම රූපවලින් දැක්වෙන සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ දක්වන පිළිතුර තෝරන්න.

**30.** ළමයකු නින්දෙන් අවදි වී සූදානම් වී පාසල් යාමට පිටත්වීම




(1) BCADE (2) BCEDA (3) CBDEA (4) ADCBE


**31.** ළමයකු පාසල් ගොස් පන්ති කාමරයක පාඩමකට සහභාගි වීම



(1) ACEDB (2) CEDAB (3) CDEAB (4) ECDBA

**32.** මෙම රූප දෙක එකතු කළ විට ලැබෙන රූපය කුමක් ද?





(1) (2) (3) (4)

**33.** මෙම රූප දෙක එකතු කළ විට ලැබෙන රූපය කුමක් ද?





(1) (2) (3) (4)

* **අංක 34 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට පිළිතුර තිත් ඉර මත ලියන්න.**

● අංක **34** සහ **35** ප්‍රශ්නවල දැක්වෙන විස්තරවලින් කියැවෙන වචනය ලියා දක්වන්න.

34. මුල් අකුර **පහනෙහි** ඇත. එහෙත් **යහනෙහි** නැත.
දෙවන අකුර **වනයෙහි** ඇත. එහෙත් **පැනයෙහි** නැත.
තෙවන අකුර **නගයෙහි** ඇත. එහෙත් **දහයෙහි** නැත.

..............................................

[8 වැනි පිටුව බලන්න

35. මුල් අකුර **ගවයෙහි** ඇත. එහෙත් **පවසෙහි** නැත.
දෙවන අකුර **තරමෙහි** ඇත. එහෙත් **තසිමෙහි** නැත.
තෙවන අකුර **වදමනෙහි** ඇත. එහෙත් **වියමනෙහි** නැත.
සිව්වන අකුර **වමනෙහි** ඇත. එහෙත් **වත්තෙහි** නැත. ...............................

● අංක **36** සහ **37** ප්‍රශ්නවල දැක්වෙන විස්තරවලින් කියැවෙන්නේ කුමක් පිළිබඳ ව දැයි ලියා දක්වන්

**36.** මම අහසේ පියාසර කරන්නෙක්මි. ඉතා ඉහළ අහසේ වළාකුළු අතරින් ද මම සමහර විට පියාඃ කරමි. පුදුමය නම් තටු නොසලා මට පියාසර කරන්නට හැකිවීමයි. මා පියාසර කරන විට ශබ්දය නිකුත් කරන නිසා පහළ ඉන්නා අයට මා අහසේ පියාසර කරන බව දැනෙයි. විශේෂයෙන් කු ළමයින් මා දෙස බලමින් ප්‍රීතිවන බව මම දනිමි. මම ගස්වල නොලගිමි. මා පහත්වන්නේ විශේෂ ස්ථානවලට පමණි. ...............................

**37.** මගේ පැහැය විවිධ ය. සමහර විටක මම රතුපාට වෙමි; දුඹුරු පාට වෙමි; නිල්පාට වෙ සුදුපාට වෙමි. සමහර විටක මට පාටක් ඇත්තේ ම නැත. මිනිස්සු මා පානය කරති. ඒ විට අවස්ථාවල ය. මා පානය කිරීමෙන් මිනිසුන්ට යහපතක් මිස අයහපතක් නොසැලසේ. එහෙ බොහෝ මිනිසුන් මා පානය කරන්නේ කැමැත්තෙන් නො වන බව මම දනිමි. විශේෂයෙන් කු ළමයින් මා පානය කිරීමට දක්වන්නේ නොකැමැත්තක් ම ය. ...............................

● මේ කවි දෙක ඇසුරෙන් අංක **38** සහ **39** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සිරින් පිරි බක් මස
පලින් ............ අඹ ගස
උදයේ සහ සවස
බලා සිටිනෙමි නොසින් ඒ දෙස

අතුපත්‍ර අඹ ගස
සිට එයි කුරුළු තුටු ගොස
අසමින් එනද රස
රැඳී සිටිනෙමි නගා මදහස

**38.** (i) "ඒ දෙස" යන්නෙහි "ඒ" යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? ...............................

(ii) "කුරුළු තුටුගොස" එන්නේ කොහි සිට ද? ...............................

**39.** (i) පළමුවන කවියෙහි හිස්තැනට සුදුසු වචනයක් ලියන්න. ...............................

(ii) සතුට යන අර්ථය ගෙන දෙන වචන දෙකක් මේ කවි දෙකේ යෙදී ඇත. එම වචන **දෙක** මොනවා ද? ............... ...............

**40.** ඡේදයේ හිස්තැන්වලට වඩාත් ම ගැළපෙන වචන වරහන් තුළින් තෝරා **හිස්තැන්** පුරවන්න.

එක්තරා පුද්ගලයෙක්, මිත්‍රයකු සමඟ වනයක් මැදින් ගමනක් යනවිට දරුණු කොටියකු ඉදිරියට එන බව දැක, පණ බේරා ගැනීම පිණිස ගසකට නැග ගත්තේ ය. අනෙකාට ගස් නැගීමට ................................... නොතිබුණෙන් මැරුණු
(කැමැත්තක්/හුරුවක්/නැඹුරුවක්)

මිනිසකු ලෙස බිම ...................................
(වැතිර ගත්තේය/වැටුණේය/වාඩිවුණේය)

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2008

**පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යත්වාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය. 2008 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 මිනිත්තු 15 යි.**

...තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ...ක්කමෙන් | |
| ...රෙන් | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| ...ර පත්‍ර පරීක්ෂක | | |
| ...ඩු පරීක්ෂක | | |
| ...ත පරීක්ෂක | | |
| ...ෂක | | |

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

**විභාග අංකය** ...................................

* ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය ලියන්න.**
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **54** ක් ඇත. (සමහර ප්‍රශ්නවල අනුකොටස් ඇත.) **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු **තිත් ඉර මත ලියන්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසි එකක් සපයනු ලැබේ.

[ 2 වැනි පිටුව බලන්න.

**පහත දැක්වෙන කවි පෙළ කියවන්න.**

පලා පැහැය හැම කල්හිම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද
දළු ලා යළි පැළ වේ

නිල් පලසක් එලුවා සේ
රුහුණු රටේ වෙල් යායයි
පියගැට පෙළ කැපුවා සේ
උඩරට පොඩි ලියදි පෙළයි

(මහගම සේකර)

කවි පෙළ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉර මත** ලියන්න.

(i) පහත සඳහන් එකිනෙකෙහි අදහස ලියන්න.

(අ) **පලා පැහැය** ..............................................................

(ආ) **පියගැට පෙළ** ..............................................................

(ii) **'යළි'** යන්නට සමාන වචනයක් ලියන්න.

..............................................................

(iii) මෙහි කියැවෙන **උපමාවක්** ලියන්න.

..............................................................

(iv) කවි පෙළෙහි සඳහන් ශ්‍රී ලංකාවේ **ප්‍රදේශ දෙක** නම් කරන්න.

..............................................................

(v) **"ඉවත දමන දඬුව වුව ද - දළු ලා යළි පැළ වේ"** යන්නෙන් කවියා ඉස්මතු කිරීමට තැත් කරන අදහස කුමක් ද?

..............................................................

පහත එක් එක් යෙදුමේ අදහස ලියන්න.

(i) **ඉගුරු දී මිරිස් ගත්තා වගේ**

..............................................................

(ii) **ජාඩියට මුඩිය වගේ**

..............................................................

පහත දැක්වෙන වාක්‍යවල නියමිත ස්ථානවල **විරාම ලකුණු** යොදන්න.

(i) එම මලේ රතු නිල් සහ දම් පැහැති පෙති හයක් තිබුණි

(ii) පියාණෙනි ඔබට සෙත්වේවා

[ 3 වැනි පිටුව බලන්න.

4. කොටුව තුළ ඇති වචන පමණක් යොදා ගෙන නිවැරදි අර්ථවත් වැකි **තුනක්** ලියන්න. එක් එක් වැකියට වචන **හතරක්**වත් ඇතුළත් කරන්න. **එක් වචනයක් එක** වරක් පමණක් යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| මට | මැද්දේය | ආහාර | නිල | රාත්‍රියෙහි | පාන්දරින් |
| තෑගී | කලෙම් | සුදනම් | කවි | පොතේ | පෙරදින |
| මම | කළාය | පාඩම් | බැගය | පාසල් | සිංහල |
| පියා | පිසුවාය | ඇඳුම් | අවදිවී | පොත් | මගේ |

(i) ..............................

(ii) ..............................

(iii) ..............................

5. හිස්තැනට ගැළපෙන පිළිතුර ලියන්න.

(i)  This is a ..............................

(ii) **රාත්‍රියට** ඉංග්‍රීසියෙන් කියන නම **ඉංග්‍රීසි** අකුරෙන් ලියන්න.

..............................

6. පහත සඳහන් වාක්‍යයෙහි අදහස **ඉංග්‍රීසියට හරවා ඉංග්‍රීසියෙන්** ලියන්න.

"කරුණාකර ඔබගේ පෑන මට දෙන්න."

..............................

- ප්‍රශ්න අංක **7** සහ **8** හි වැකිවල අර්ථය **සිංහලෙන්** ලියන්න.

7. I will bring flowers ..............................


8. **එනදු ඌර් යාල්පානම්** ..............................

9. **මෙහෙ එන්න** යන වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

..............................

- ප්‍රශ්න අංක **10** සිට **35** තෙක් ප්‍රශ්නවල **නිවැරදි** පිළිතුරට **යටින් ඉරක් අඳින්න**.

10. මෙම රූපයෙන් පෙන්නුම් කෙරෙන ශාකය වන්නේ,



(1) ඉරමුසු ය.
(2) වැල්පෙනෙල ය.
(3) ඉරිවේරිය ය.
(4) මුකුණුවැන්න ය.

11. අනතුරක් සිදුවන බව දැනුණු වහා ම තම ශරීරය රෝදයක් සේ හකුළුවා ගන්නා සතකු වන්නේ
(1) බිංකුණ්ඩා ය. (2) හැකරැල්ලා ය. (3) කුඩැල්ලා ය. (4) දළඹුවා ය.

12. වැස්සක් ළඟ එන බව හඳුනාගත හැකි සත්ත්ව හැසිරීමක් වන්නේ,
(1) බළලුන් කෑ ගැසීම ය. (2) නරියන් හූ කීම ය.
(3) බල්ලන් බිරීම ය. (4) මෙරුවන් ඉගිලී යාම ය.

[ 4 වැනි පිටුව

13. රාත්‍රි කාලයේ දී සැරිසරන පක්ෂියකු වන්නේ,
(1) උලමා ය. (2) කැරලා ය. (3) පිළිහුඩුවා ය. (4) කොරවක්කා ය.

14. පහත සඳහන් කවර අවස්ථාවක දී නිවසේ වෙසෙන බල්ලා උඩු බුරලන්නේ ද?
(1) තම සීමාවට වෙනත් බල්ලකු පැමිණි විට
(2) අමුත්තකු නිවස දෙසට පැමිණෙන විට
(3) බල්ලාට දුකක් හෝ පාළුවක් හෝ දැනෙන විට
(4) කිසිවකු විසින් බල්ලාට හිරිහැරයක් කරනු ලැබූ විට

15. **'කළු පොල් මාලුව'** පිළියෙල කර ගැනීමේ දී යොදා ගනු ලබන බීජ වර්ගයක් වන්නේ,
(1) කළුකවුපි ය. (2) කොස්ඇට ය. (3) රටදෙල් ය. (4) බිංපොල් ය.

16. පියනකින් **නො වසා** පිසිය යුතු ආහාර වර්ගයක් වන්නේ,
(1) බතල ය. (2) දෙල් ය. (3) මඤ්ඤොක්කා ය. (4) කොස් ය.

17. ඇලුමිනියම් භාජනයක පිසිනු ලබන ආහාරයකට මිශ්‍ර කිරීමට **නුසුදුසු** ද්‍රව්‍යයක් වන්නේ,
(1) කුරුඳු ය. (2) සුදුළූනු ය. (3) ගොරකා ය. (4) ඉඟුරු ය.

18. අත්වල කොහොල්ලෑ ගැවුන විට ඒවා පහසුවෙන් ඉවත් කර ගැනීමට යොදා ගත හැකි වඩාත් ම සුදුසු දේ වන්නේ,
(1) සබන් ය. (2) ඇල්ජලය ය. (3) උණුජලය ය. (4) භූමිතෙල් ය.

19. නිල් සහ රතු සායම් මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය කුමක් ද?
(1) කොළ (2) දම් (3) කහ (4) කළු

20. දැල්පන්දු (නෙට්බෝල්) කණ්ඩායමක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව වන්නේ, (අතිරේක ක්‍රීඩිකාවන් හැර)
(1) 6 කි. (2) 7 කි. (3) 8 කි. (4) 9 කි.

21. ධාවකයකු දිවීම අවසන් වූ **වහා ම** කළ යුතු වන්නේ,
(1) කෙටි වේලාවක් බිම දිගා වී සිටීම ය. (2) සිසිල් කළ පානයක් ගැනීම ය.
(3) සිරුර ජලයෙන් තෙමා ගැනීම ය. (4) සරල ව්‍යායාමයක යෙදීම ය.

22. **පදිංචිය** සනාථ කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා යා යුත්තේ,
(1) ප්‍රාදේශීය ලේකම් වෙත ය. (2) ග්‍රාම නිලධාරී වෙත ය.
(3) පොලිස් ස්ථානාධිපති වෙත ය. (4) සමෘද්ධි නියාමක වෙත ය.


23. සැක කටයුතු පාර්සලයක් දුටු විගස ආරක්ෂාව සඳහා දැන්විය යුතු දුරකථන අංකය වන්නේ,
(1) 119 (2) 147 (3) 456 (4) 1919

24. නියමිත වර්ණ නො යොදා ඉදිරිපත් කර ඇති පහත ලාංඡන අතුරෙන් **ශ්‍රී ලංකාවේ තැපැල් සේවාවේ** ලාංඡනය තෝරන්න.
(1) (2) (3) (4)

25. මහසෙන් රජතුමා විසින් කරවන ලද වැවක් වන්නේ,
(1) තිසාවැව ය. (2) මින්නේරිවැව ය. (3) කලාවැව ය. (4) පරාක්‍රම සමුද්‍රය ය.

[ 5 වැනි පිටුව බලන්න

● දී ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරෙන් අංක **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**26.** පොළොන්නරුව නගරය දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අකුරෙන් ද?

(1) A (2) B
(3) C (4) D

**27.** කළු ගඟ දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අකුරෙන් ද?

(1) W (2) X
(3) Y (4) Z

**28.** "ඔන්න මලේ මය නාමල නෙළා වරෙන්
අත්ත බිදෙයි පය බුරුලෙන් තබා වරෙන්"

ඉහත කවි පද දෙක අයත් වන්නේ කිනම් ජනකවි වර්ගයට ද?

(1) පතල් කවි (2) පාරු කවි (3) ගොයම් කවි (4) පැල් කවි

**29.** රූප සටහනේ දැක්වෙන පොලිස් නිලධාරියා ලබාදෙන සංඥාවෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?



(1) පිටුපසින් එන වාහන පමණක් නතර වෙනු.
(2) ඉදිරියෙන් එන වාහන පමණක් නතර වෙනු.
(3) ඉදිරියෙන් සහ පිටුපසින් එන සියලු ම වාහන නතර වෙනු.
(4) ඉදිරියෙන් සහ පිටුපසින් එන සියලු ම වාහන නොනවත්වා යනු.

**30.** ගමනාගමනය සඳහා වැඩි වැඩියෙන් පාපැදි භාවිතය හා සම්බන්ධ **වැරදි** ප්‍රකාශය වන්නේ

(1) පරිසර දූෂණය අඩු කර ගත හැකි ය.
(2) ගමනාගමන වියදම් අඩු කර ගත හැකි ය.
(3) අනතුරු අඩු කර ගත හැකි ය.
(4) ලෙඩ රෝග අඩු කර ගත හැකි ය.


**31.** චන්ද්‍රග්‍රහණයක් ආරම්භ වන විට,

(1) චන්ද්‍රයා ක්‍රමයෙන් අඳුරු වේ. (2) චන්ද්‍රයා එකවර අඳුරු වේ.
(3) චන්ද්‍රයාගේ දීප්තිය ක්‍රමයෙන් වැඩි වේ. (4) චන්ද්‍රයාගේ දීප්තිය එකවර වැඩි වේ.

**32.** මළ බැඳුණු ඇණයක් පාදයක ඇනුණු අයකුට නොපමාව බීමට දිය යුතු සුදුසු ඖෂධීය පානය වන්නේ,


(1) කොත්තමල්ලි (2) වෙනිවැල්ගැට (3) බෙලිමල් (4) රණවරාමල්

**33.** ජලය පිරවූ බෝතලයක කට, තේ පෙරණයකින් වසා රූප සටහනේ දැක්වෙන පරිදි පහළට හරවා අල්ලා ගත් විට බෝතලයේ ජලය



(1) බිංදු වශයෙන් පහළට වැටෙයි.
(2) තනි දියපහරක් සේ පහළට ගලයි.
(3) සිහින් දියපහරවල් ලෙස විසිරෙයි.
(4) පහළට නොවැටී පවතියි.

**34.** ජලය පිරි වීදුරුවක පතුලේ ඇති වීදුරු බෝලයක් රූපයේ පෙන්වා ඇත. ජල මට්ටමට ඉහළින් ඇස් තබා බැලූ විට බෝලය පෙනෙන්නේ,




(1) නියමිත ප්‍රමාණයට සමානව නියමිත ගැඹුරේ පිහිටා ඇති ලෙස ය.
(2) නියමිත ප්‍රමාණයට සමානව අඩු ගැඹුරක පිහිටා ඇති ලෙස ය.
(3) නියමිත ප්‍රමාණයට වඩා විශාලව නියමිත ගැඹුරේ පිහිටා ඇති ලෙස ය.
(4) නියමිත ප්‍රමාණයට වඩා විශාලව අඩු ගැඹුරක පිහිටා ඇති ලෙස ය.

[ 6 වැනි පිටුව බලන්


35. කඩදාසියක දවටා ඇති A නම් ඝන වස්තුවක් සහ කොයිල් කම්බියක් ඔතන ලද B නම් යකඩ ඇණයක් 1 රූපයෙන් දක්වේ. කම්බියේ දෙකෙළවර වියළි කෝෂයකට සම්බන්ධ කළ විට A වස්තුව පිහිටන ආකාරය 2 රූපයෙන් දැක්වේ.

A නම් ඝන වස්තුව විය හැක්කේ

(1) පිත්තල කැබැල්ලකි.
(2) යකඩ කැබැල්ලකි.
(3) ඇලුමිනියම් කැබැල්ලකි.
(4) කාන්දම් කැබැල්ලකි.




1 රූපය




2 රූපය


36. බල්බයක් වියළි කෝෂයකට ස්පර්ශ වන සේ තබා, තනි කම්බි කැබැල්ලක් යොදා ගෙන දැල්විය හැකි එක් ආකාරයක් 1 රූපයේ පෙන්වා ඇත. එම කම්බිය ම යොදා ගෙන බල්බය දැල්විය හැකි තවත් ආකාරයක් 2 රූපයේ කොටුව තුළ අඳින්න.



1 රූපය



2 රූපය

- ගොඩනැගිලි ඉදිකිරීමේ දී යොදා ගනු ලබන උපකරණ කිහිපයක් පහත සඳහන් වේ.


(1)


(2)


(3)


(4)


(5)

පහත එක් එක් කාර්යය සඳහා යොදා ගන්නා **උපකරණය දැක්වෙන අංකය** අදාළ හිස්තැනෙහි ලියන්න.

37. බැම් ඉදිකිරීමේ දී සිරස් බව පවත්වා ගැනීමට ..............................

38. බාල්කවල තිරස් බව පවත්වා ගැනීමට ..............................

39. බදාම හා කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමට ..............................


40. **චතුස්තලයක්** රූපයේ පෙන්වා ඇත. එහි

(i) මුහුණත් ගණන කීය ද?

..............................

(ii) ශීර්ෂ ගණන කීය ද?

..............................



41. **"විසි දහස් පනහ"** ඉලක්කමෙන් ලියන්න. ..............................

42. ගමනක ආරම්භයේ දී වාහනයක මීටරයේ ඉලක්කම් සටහන් වී තිබුණේ මෙසේ ය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 0 | 1 | 2 | 9 | 9 | 0 | km |


වාහනය තව කිලෝමීටර **දහයක්** ගමන් කළ පසු මීටරයේ සටහන් වන ඉලක්කම් හිස් කොටු තුළ ලියන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | km |

[ 7 වැනි පිටුව බලන්න.

**43.** රූපයේ පෙන්වා ඇති තරාදියේ A තැටියේ බෝලයක් ද B තැටියේ 1 kg තරාදි පඩියක් ද ඇත. රූපයේ තොරතුරු ඇසුරෙන් පහත වාක්‍යය සම්පූර්ණ කරන්න.

**බෝලයේ බර කිලෝග්‍රෑම් එකකට** ........................................





**44.** අසම්පූර්ණ බිල්පතක් පහත වගුවේ දැක්වේ. එහි ඇති **හිස්තැන් හතර** සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකක මිල | | මුදල | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | ශත | රුපියල් | ශත |
| අභ්‍යාස පොත් | 6 | 20 | 00 | 120 | 00 |
| පැන්සල් | 2 | ......... | ...... | 16 | 50 |
| පෑන් | ......... | 9 | 00 | 27 | 00 |
| ලියුම් කවර | 3 | ......... | ...... | 4 | 50 |
| **එකතුව** | | | | ......... | ...... |

**45.** හාල් කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 48 කි. හාල් 2 kg 500 g ක මිල කොපමණ ද?

රුපියල් ........................................

**46.** වත්තකට පැමිණි කුරුළු වර්ග හතරක් ගැන සඳහන් වන අසම්පූර්ණ ප්‍රස්තාරයක් රූපයේ දැක්වේ. එහි පැමිණි ගිරවුන් සංඛ්‍යාව, එහි පැමිණි මයිනන් සහ පරවියන් සංඛ්‍යාවල එකතුවට සමාන වේ. ප්‍රස්තාරයේ අදාළ තීරයේ ගිරවුන් සංඛ්‍යාව ලකුණු කර, තීරය අඳුරු කරන්න.




**47.** ටැංකියකට පිරවිය හැකි මුළු ජලය පරිමාව ලීටර 8 750 ක් වේ. එහි ජලය ලීටර 3 695 ක් දැනට පිරී ඇත. ඉතිරිය පිරවීමට අවශ්‍ය ජලය පරිමාව කොපමණ ද?

ලීටර ........................................

**48.** තේ හැන්දකට අල්ලන දියර පරිමාව 5 ml වේ. රෝගියකුට තේ හැඳි දෙක බැගින් දිනකට තුන්වරක් බෙහෙත් බීමට දෙන ලදී. දිනක දී බොන ලද බෙහෙත් පරිමාව කොපමණ ද?

........................................ ml

**49.** දිග 5 m වූ රිබන් පටියකින් 20 cm කැබලි 5 ක් කපා ගන්නා ලදී. රිබන් පටියේ ඉතුරු කොටසේ දිග කොපමණ ද?

........................................

**50.** පෙරවරු 10.00 ට පිටත්වීමට නියමිත බස්රථයක් ගමන පටන් ගත්තේ මිනිත්තු 20 කට පසුව ය. ගමනට ගත වූ කාලය පැය 4 මිනිත්තු 45 කි. එය ගමනාන්තයට ළඟා වූ වේලාව කීය ද?

........................................


**51.** එකතු කරන්න. $\frac{1}{6}+\frac{2}{3}=$ ........................................

[ 8 වැනි පිටුව බලන්න.

52. එක් අයකුට 3 බැගින් පොත් 320ක් කී දෙනකුට බෙදා දිය හැකි ද? ....................

ඉතුරු කීය ද? ....................


53. නගර හයක් යාකරන මාර්ගයක සැලැස්මක් රූපයේ පෙන්වා ඇත. මිනිසෙක් A නගරයෙන් පටන්ගෙන B, C, D, E සහ F නගර හරහා මාර්ගය ඔස්සේ ගමන් කර නැවත A වෙත පැමිණෙයි. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද?




.......................................................... km

54. "තරිඳු සහ යහළුවෝ නැමට ගඟට ගියෝ ය. ගංතොටෙහි පුරුදු පරිදි සෙල්ලම් කර ඔවුහු නැමට දියට බැස්සෝ ය."

මෙය සිදුවීමක ආරම්භයයි. ඉදිරියේ දී සිදුවන්නට ඇතැයි ඔබ සිතන දේ පහත සඳහන් රූප රාමු ඇසුරු කරගෙන, නිර්මාණාත්මක ව ලියන්න. ඔබගේ අදහස් වාක්‍ය හයකට සීමා කරන්න. එක් එක් වාක්‍යයේ අඩු වශයෙන් වචන හතරක්වත් ඇතුළත් විය යුතු ය. එම වාක්‍යවල උක්තාඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.







(i) ..........................................................

..........................................................

(ii) ..........................................................

..........................................................

(iii) ..........................................................

..........................................................

(iv) ..........................................................

..........................................................

(v) ..........................................................

..........................................................

(vi) ..........................................................

..........................................................

❋ ❋ ❋